**සී/ස ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සි සමාගම - 2020**

**------------------------------------------------------------**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

**-----------------------------**

සී/ස ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සි සමාගමේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන්, සාරාංශ ගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සමාගමෙහි 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**--------------------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිතිය යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්**

**------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.
සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණනයේ වගකීම්

--------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන**

---------------

**1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය**

--------------------------------------------------------------

ගණුදෙනු කළමනාකාරිත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරිබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට අවශ්‍ය වන පරිදි ගණුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරිත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරි බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානු වලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබා ගැනීමට ප්‍රමාණවත් "මනා ලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් සමාගම විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

**1.5.2 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

---------------------------------------------------

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 හි 34 ඡේදය ප්‍රකාරව සමාගම සතු පිරිවැය රු. 74,370,330 ක් වටිනා දේපළ, පිරියත හා උපකරණ සම්බන්ධයෙන් 2013 වර්ෂයෙන් පසු ප්‍රත්‍යාගණනයක් කර ඒවායෙහි නිවැරදි වටිනාකම මූල්‍ය ප්‍රකාශන වල ඇතුලත් කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේදී අදාල ප්‍රත්‍යාගණනය කිරීම් සිදුකර ඉදිරිපත් කරන්නෙමු. | ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව වත්කම් වල නිවැරදි වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් කිරීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත **16** හි **51** ඡේදය ප්‍රකාරව සමාගම විසින් වාර්ෂික ක්ෂය ගණනය කිරීමේදී, එහි වත්කම් සම්බන්ධයෙන් අවශේෂ වටිනාකම සහ ප්‍රයෝජනවත් ජීව කාලය සමාලෝචනය නොකිරීම හේතුවෙන්, තවදුරටත් භාවිතයට ගනිමින් පැවති පිරිවැය රු. **7,579,020** ක් වූ වත්කම් වර්ග දෙකක ධාරණ අගය ශූන්‍ය අගයක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | ඉදිරි වර්ෂයේදී භාණ්ඩ නැවත ඇගයීමක් කර අදාල වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවල සටහන් කිරීමට කටයුතු කරන්නෙමු. | ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව වත්කම් වල නිවැරදි වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් කිරීමට කටයුතු කළ යුතුය. |

**1.5.3** ගිණුම්කරණ අඩුපාඩු

----------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයට අදාලව රු. **1,992,479** ක් වූ ලැබිය යුතු පොළී ආදායම මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දක්වා තිබීම හේතුවෙන් එම වටිනාකමින් ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල් ගලා ඒම වැඩියෙන් සටහන් කර තිබුණි. | මුදලින් ලද පොළී ආදායම වශයෙන් මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි දක්වා ඇති රු. **8,692,784** ක් වූ මුදලින් උපචිත පදනම මත ගණනය කරන ලද මුදල වන්නේ රු. **1,992,479** ක් පමණි. | මුදල් ප්‍රවාහ ප්‍රකාශය නිවැරදිව පිළියෙල කල යුතුය. |
| (ආ) ආදායම් ප්‍රකාශනයට අනුව පාරිතෝෂික වියදම රු. **518,880** ක් වුවත්, මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ බදු පෙර ලාභයට පාරිතෝෂික වියදම් ලෙස රු. **1,045,074** ක් එකතු කර තිබුණි. ඒ අනුව මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය රු. **526,194** ක් වැඩියෙන් දක්වා තිබුණි. | ඉදිරි වර්ෂයේදී අදාළ නිවැරදි කිරීම් සිදුකර ඉදිරිපත් කරන්නෙමු. | මුදල් ප්‍රවාහ ප්‍රකාශය නිවැරදිව පිළියෙල කල යුතුය. |
| (ඇ) සමාලෝචිත වර්ෂයට අදාල රු. **166,830** ක විදේශ විනිමය හුවමාරු අලාභය, මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ බදු පෙර අලාභයට ගලපා නොතිබුණි. | ඉදිරි වර්ෂයේදී අදාළ නිවැරදි කිරීම් සිදුකර ඉදිරිපත් කරන්නෙමු. | මුදල් ප්‍රවාහ ප්‍රකාශය නිවැරදිව පිළියෙල කල යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාගමේ මූල්‍ය ප්‍රකාශන අනුව, 2000 වර්ෂයේ සිට 2018 දක්වා කාලපරිච්ඡේදයන්ට අදාලව ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයෙන් කොමිස් මුදල් ඇතුළුව ලැබිය යුතු එකතුව රු. 7,224,694 ක් අයකර ගැනීමෙන් තොරව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා මූල්‍ය ප්‍රකාශනවල ලැබිය යුතු ශේෂ ලෙස ඉදිරියට ගෙන එමින් පැවතුණි. | ඉදිරියේදී මේ පිළිබඳ සලකාබලා අදාල මුදල් අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ. | අවශ්‍ය ලේඛන නිසි පරිදි ඉදිරිපත් කර ලැබිය යුතු මුදල් අයකර ගැනීමට කටයුතු කල යුතුය. |

### 1.6.2 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2013 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා කාලපරිච්ඡේදයට අදාලව විදේශ රැකියා සඳහා ගොස් මිය ගිය ශ්‍රමිකයන්ට ගෙවිය යුතු එකතුව රු. 7,490,081 ක මරණ වන්දි ගෙවා නිදහස් කර නොතිබුණි. | මෙම ප්‍රමාදයට හේතුව විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් නීත්‍යානුකූල වන්දි ලාභීන්ගේ නාම ලේඛණ ඉදිරිපත් කිරීමට තවමත් නොහැකි වීමයි. කාර්යාංශයේ නාම ලේඛණ ලැබුණු විගස ගෙවීම සිදුකරනු ලබයි. | ශ්‍රමිකයන් වෙනුවෙන් ලැබී ඇති මරණ වන්දි දීර්ඝ කාලීනව ගෙවා නිදහස් නොකිරීමට හේතු සොයාබලා එවැනි තත්ත්වයන් නැවත ඇති නොවීමට කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ)2007 අංක 07 දරන සමාගම් පනතේ 133 වගන්තිය | පනතෙහි සඳහන් විධිවිධාන ප්‍රකාරව සමාගම විසින් වාර්ෂික මහ සභා රැස්වීම් පැවැත්වීමට කටයුතු කර නොතිබුණි. | සමාගමේ පූර්ණ කොටස් හිමිකාරීත්වය විදේශ සේවා නියුක්ති කාර්යාංශය සතු වන බැවින් සහ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන කාර්යාංශය වෙත ලබා දෙන බැවින් වාර්ෂික මහා සභා රැස්වීම් පවත්වා නොමැත. | සමාගම් පනතෙහි සඳහන් විධිවිධාන අනුගමනය කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ)2003 ජුනි 02 දිනැති අංක පිඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය සහ 2004 පෙබරවාරි 24 දිනැති අංක/ 01/2004 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | මූල්‍ය ප්‍රකාශන ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම 2020 ජුලි 15 දින දක්වා දින 116 ක් ප්‍රමාද කර තිබුණි. | රටේ පැවති කොවිඩ් උවදුර හේතුවෙන් සකස් කරන ලද මූල්‍ය ප්‍රකාශන වලට අදාල අනුමැතිය ලබා ගැනීම ප්‍රමාද විය. | මූල්‍ය ප්‍රකාශන නියමිත දිනට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය. |
| (ඇ) 1978 දෙසැම්බර් 19 දිනැති අංක/ 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | සමාගම සතු පිරිවැය රු. 83,714,143 ක් වූ දේපල පිරියත හා උපකරණ වලට අදාල යාවත්කාලීන කරන ලද ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා ගැනීමට කටයුතු කරමි. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව යාවත්කාලීන කරන ලද ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා ගත යුතුය. |

**2.** මූල්‍ය සමාලෝචනය

**2.1** මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 6,802,673 ක අලාභයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අලාභය රු. 3,015,784 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 3,786,889 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට සේවා සැපයීම් ආදායම රු. 2,687,358 ක් හා ස්ථාවර තැන්පතු පොළී ආදායම රු. 1,846,187 කින් අඩුවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

**2.2** ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවනතා විශ්ලේෂණය

සමාගමෙහි සමස්ත ආදායමින් සියයට 45.7 ක් ස්ථාවර තැන්පතු ආයෝජන මඟින් උපයන ලද පොළිය වූ අතර ව්‍යාපාරික කටයුතු වලින් උපයන ආදායම පෙර වර්ෂයට සාපේක්ෂව රු. 2,687,358 කින් අඩු වී තිබුණි. සමාලෝචිත වර්ෂයේ සමස්ථ ආදායම වූ රු. 18,340,074 කින් සියයට 80.87 ක් එනම් රු. 14,832,188 ක් සේවක පිරිවැය වෙනුවෙන් වැයකර තිබුණි.

**3.** මෙහෙයුම් සමාලෝචනය

**3.1** කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ශ්‍රමිකයින් 09 දෙනෙකු විසින් රැකියා සඳහා විදේශගතවීමට අපේක්ෂාවෙන් සමාගමට භාර දී තිබූ විදේශ ගමන් බලපත්‍ර අස්ථානගත වී තිබුණි. ඒ සම්බන්ධයෙන්, පොලිසිය හා ආගමන හා විගමන දෙපාර්තමේන්තුව කඩිනමින් දැනුවත් කිරීමට කටයුතු කර නොතිබුණු අතර මෙම විදේශ ගමන් බලපත්‍ර නැතිවීම පිළිබඳව වගකිවයුතු නිලධාරීන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගැනීමෙන් තොරව, නැවත ඉල්ලුම්කරන ලද එක් ගමන් බලපත්‍රයක් සකස් කිරීම සඳහා රු. 11,500 ක දඩ මුදලක් සහිතව රු. 15,000 ක නිෂ්කාර්යය වැයක් දරා තිබුණි. එසේම අස්ථානගත වූ ඉතිරි ගමන් බලපත්‍ර පිළිබඳ තීරණයක් ගෙන නොතිබුණි. | ඉහළ කළමනාකාරීත්වයෙන් ලබා දෙන ලද වාචික උපදෙස් අනුව පොලිසියේ පැමිණිල්ලක් සිදු නොකර විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ නීති හා විමර්ශන අංශය හා අභ්‍යන්තර විගණන අංශය මගින් විමර්ශනයක් සිදු කර ඇත. අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ඇතිව එක් ගමන් බලපත්‍රයක් සාදා ඇත. ආයතනය වෙත භාර දෙන ලද සහ ඔවුන් විසින් ආපසු භාර ගැනීමට ඉදිරිපත් නොවූ විදේශ ගමන් බලපත්‍ර 1035 ක ලැයිස්තුවක් විදේශ සේවා නියුක්ති කාර්යාංශය වෙත අවශ්‍ය කටයුතු සිදු කිරීම සඳහා ඉදිරිපත් කර ඇත. | ගමන් බලපත්‍ර වැරදි භාවිතය වැළැක්වීමට කඩිනම් පියවර ගතයුතුව තිබුණු අතර නොසැලකිළිමත්ව කටයුතු කළ නිලධාරීන් සම්බන්ධයෙන් විනය ක්‍රියාමාර්ග ගත යුතුය. |

**3.2** මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2019 හා 2020 වර්ෂවල සමාගමට රටවල් 05 කින් වසර දෙකක් දක්වා වලංගු රැකියා ඇණවුම් 14 ක් යටතේ රැකියා අවස්ථා 1492 ක් ලැබී තිබුණද, විගණිත දිනය වූ 2021 මාර්තු 30 දින වන විටත් විදේශගත කර තිබුණේ ශ්‍රමිකයින් 20 දෙනෙකු පමණි. ජපන් රජයෙන් වෘත්තීය හා වෘත්තීය පුහුණු ක්ෂේත්‍ර වලට අදාලව රැකියා ඇණවුම් 04 ක් යටතේ රැකියා අවස්ථා 481 ක් ලැබී තිබුණ ද, ඉන් ශ්‍රමිකයින් 15 දෙනෙකු පමණක් රැකියා සඳහා යොමුකර තිබුණි. එමෙන්ම සමාගමෙහි ඉදිරිපැවැත්ම සඳහා | පසුගිය කාලපරිච්ඡේදයේ පැවති ගෝලීය වසංගත තත්ත්වය මත රැකියා ඇණවුම් සඳහා ශ්‍රමිකයින් විදෙස් ගතකිරීම අවම මට්මක පැවතුනි. එමෙන්ම විදෙස් රටවල උප නියෝජිතයින් මගින් කොමිස් මුදල් ගෙවා රැකියා ඇණවුම් ලබාගැනීමේ හැකියාවක් අප ආයතනය සතුව නොමැත. 2017 වර්ෂයෙන් පසුව රැකියා ප්‍රවර්ධන කටයුතු සඳහා ආයතනයේ නිලධාරීන් විදේශ | රාජ්‍ය අනුග්‍රහය සහිත මෙම ව්‍යාපාරික අවස්ථාව ප්‍රයෝජනයට ගෙන සමාගම ආරම්භ කිරීමේ අරමුණ ඉටුකර ගැනීමට කළමණාකරණයෙහි අවධානය යොමු විය යුතුය. |

| | | |
|---|---|---|
| උපායක්‍රමික සැලැස්මක් මත කළමණාකරණය කටයුතු කර නොතිබුණි. ඒ අනුව, සියලු අංශ සඳහා ශ්‍රී ලාංකික ශ්‍රමිකයින් සැපයීම හා රැකියා නියෝජිතයෙකු ලෙස කටයුතු කිරිම සඳහා රජයේ අනුග්‍රහය ලත් සහ රජයේ සුරක්ෂිතතාවය සහිත එකම රැකියා නියෝජිත ආයතනය වූ මෙම සමාගමෙහි කාර්යසාධනය පසුගිය වර්ෂවල මෙන්ම සමාලෝචිත වර්ෂයේදීද ඉතාමත් දුර්වල තත්ත්වයක පැවති බව නිරීක්ෂණය විය. | සංචාර සඳහා ද සහභාගී නොවීය. | |

**3.4 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල පිරියත හා උපකරණ**

---------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාගම විසින් පෞද්ගලික ආයතනයක් සමඟ ඇතිකරගත් ගිවිසුමකට අනුව 2014 වර්ෂයේදී ආරම්භකරන ලද ඉන්සිලැබ් වෛද්‍ය මධ්‍යස්ථානයට රු. 3,476,298 ක් වටිනා කාර්යාල උපකරණ ලබා දී තිබුණු අතර මුදල් රෙගුලාසි 751,753 හා 756 ප්‍රකාරව පිළිවෙලින් එම භාණ්ඩ භාරදීම, ලේඛනගත කිරීම සහ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම සිදුකර නොතිබුණි. 2016 වර්ෂයේ සිට එම භාණ්ඩ සමාගමේ භාවිතයෙන් තොරව තිබී 2020 වර්ෂයේ රැගෙන විත් තිබුණද එම භාණ්ඩ නැවත භාරදෙන අවස්ථාව වන විට වටිනාකම සඳහන් නොවූ කාර්යාල උපකරණ අයිතම 03 ක ඒකක 48 ක් සහ රු. 415,675 ක් වූ භාණ්ඩ ඒකක 2 ඌනතාවයක් පැවතුණි. ඒ පිළිබඳ මු.රෙ. 760 ප්‍රකාරව කටයුතු කර නොතිබුණු අතර නැවත භාරගත් භාණ්ඩ විධිමත් පරිදි ලේඛණගතකර කාර්යාල භාවිතය සඳහා යොදා ගැනීමට හෝ අබලන් වූ භාණ්ඩ ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි. | මේ වන විට බඩු ලේඛණ පොතක භාණ්ඩ විස්තර ඇතුලත් කර ඇත. නීතිමය ක්‍රියාමාර්ග හේතුවෙන් 2019/2020 භාණ්ඩ සමීක්ෂණ පවත්වා නැත. මෙම භාණ්ඩ සමාගෙම් ප්‍රයෝජනයට ගැනීමට සැලසුම් කර ඇත. කැඩී බිඳී ගිය භාණ්ඩ පැවතීම හේතුවෙන් ඌණතාවයක් පැවතුණි. | මෙම භාණ්ඩ පළදායීව ප්‍රයෝජනයට ගැනීමට සහ අවිධිමත් පරිහරනය වලක්වා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) ගිවිසුම් ප්‍රකාරව ක්‍රියාත්මකව පැවති කාලය තුල උපයන ලද ආදායමින් රු. 107,043,120 ක් වෛද්‍ය සහතික නිකුත් කිරීම වෙනුවෙන් පෞද්ගලික | වෛද්‍ය මධ්‍යස්ථානය සමඟ ඇතිකරගත් අවබෝධතා ගිවිසුම අනුව කටයුතු කර ඇත. | මෙම වෛද්‍ය මධ්‍යස්ථානය ආරම්භ කිරීම සහ පවත්වා ගෙන යාම සමාගමට අවාසිදායක වන පරිදි |

| | | |
|---|---|---|
| ආයතනයටත්, ගොඩනැඟිලි කුලී, කාර්යාල උපකරණ හා අනෙකුත් නඩත්තු වියදම් හා සමාගමේ නාමය භාවිතා කිරීම මෙන්ම කාර්යාංශය මඟින් මධ්‍යස්ථානය වෙත ශ්‍රමිකයන් යොමු කිරීම ඇතුළු කටයුතු වෙනුවෙන් ආදායමින් සියයට 30 ක් වූ රු. 32,112,936 ක් පමණක් සමාගමට ලැබී තිබුණි. එමෙන්ම ව්‍යාජ වෛද්‍ය සහතික නිකුත් කිරීම හේතුවෙන් එම වෛද්‍ය මධ්‍යස්ථානය වසාදැමීමට සිදුවී තිබුණි. | | අවිධිමත්ව සිදුකර තිබීම කළමණාකරණ අකාර්යක්ෂමතාවයක් මෙන්ම නොසැලකිලිමත්කමක් බැවින්, ඊට වගකිව යුත්තන් සම්බන්ධයෙන් විනය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඇ) නියමිත කාලය තුල ඉහත කී පෞද්ගලික ආයතනය කුලී ගොඩනැගිල්ලෙන් ඉවත් නොවීම හේතුවෙන් නඩුවට පෙනී සිටිමටද, ගොඩනැගිල්ල සඳහා ගෙවන ලද රු. 600,000 ක අත්තිකාරම් මුදල අහිමිවීමේ අවදානමකටද සමාගමට මුහුණදීමට සිදු වී තිබුණි. | 2017 ඔක්තෝම්බර් මෙම ගැටලුව පිළිබඳව නීතිපති දෙපාර්තෙමේන්තුවට දැනුම් දී ඇත. ඒ අනුව දැනට විභාග වෙමින් පවතින නඩු දෙකක් සඳහා අවශ්‍ය නීතිමය සහාය නීතිපති දෙපාර්තෙමේන්තුව විසින් සමාගමට ලබා දී ඇත. | සමාගමට අවාසිදායක නොවන පරිදි නඩු කටයුත්ත අවසන් කර ගැනීමට කළමනාකරණය කටයුතු කළ යුතුය. |

**3.5** මානව සම්පත් කළමණාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාගම සඳහා අනුමත කාර්යය මණ්ඩලය 30 දෙනෙකු වූ අතර සමාලෝචිත වර්ෂය අවසානය වන විට ඉන් 19 දෙනෙකු පමණක් සේවයේ නියුක්ත කර තිබුණු අතර සාමාන්‍යාධිකාරී, මූල්‍ය කළමණාකරු, කළමණාකරු (පරිපාලන හා මානව සම්පත්) යන තනතුරු 03 සඳහා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ස්ථිර සේවයේ නියුක්ත නිලධාරීන් දීර්ඝ කාලයක සිට වැඩබැලීමේ පදනම මත පත්කර තිබුණි. එමෙන්ම අනුමත කාර්යය මණ්ඩලය ඉක්මවා රියදුරුවරයෙකු සේවයේ නියුක්ත කර තිබුණි. | අදාල තනතුරු වලට ස්ථිරව බඳවා ගැනීමට ආයතනයේ මූල්‍ය මට්ටම ශක්තිමත් වී නොතිබීම හා විදේශ සේවා නියුක්ති කාර්යාංශය යටතේ පරිපාලිත ආයතනයක් වන අප ආයතනය වෙත කාර්යාංශයෙන් ඒ සඳහා සුදුසුකම් හා පලපුරුදු ලත් නිලධාරීන් එහි ඉහළ කළමනාකාරීත්වය මඟින් පත් කර තිබීම මෙම තත්ත්වයට හේතු වේ. 2019 වර්ෂයේ ආයතනයේ කාර්යය මණ්ඩල හා බඳවා ගැනීමේ පටිපාටිය අනුමත කර ගැනීමට පෙර රියදුරු බඳවා ගෙන තිබුණි. | සමාගමේ අරමුණ හා පරමාර්ථ ඉටුකර ගැනීමට ප්‍රමාණවත් කාර්යය මණ්ඩලයක් ස්ථිර පදනමින් බඳවාගැනීමට කටයුතු කල යුතුය. |

4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී /12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය සහ 2004 පෙබරවාරි 24 දිනැති අංක 01/2004 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම 2020 ජුලි 15 දින දක්වා ප්‍රමාද කර තිබුණි. | 2020 වර්ෂය තුළ පැවති වසංගත තත්ත්වය මත සැලසුම් කල පරිදි මූල්‍ය ප්‍රකාශන නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට නොහැකි විය. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන නියමිත දිනට පෙර ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |